## ( 16 )

# මිහින්තලේ පුරාණ ගොඩ නැගිලි ආශ්‍රිත සත්ව රූප භාවිතය

එච්.එම්.අයි.එස් මධූෂා
සිව්වන වසර
sajeewanimadusha@gmail.com

## හැඳින්වීම

මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලංකාවේ බුදුදහම ප්‍රචලිත වීමත් සමඟ වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් හා ඒ ආශ්‍රිත කැටයම්, මූර්ති, සිතුවම් කලාව මෙරට ව්‍යාප්ත විය. මේ කලාත්මක අංග වර්ධනය කෙරෙහි භාරතීය ආභාසයද ලැබී තිබේ. නමුත් දේශීය කලා ශිල්පියා ස්වකීය දේශීය ශෛලීන් මගින් ස්වදේශික කලා නිර්මාණ බවට එම නිර්මාණ පත් පත්කර ගැනීමට සමත් වී තිබේ. හින්දු සමාජයේ දැඩි බලපෑම ශ්‍රී ලංකාවේ කැටයම් හා මූර්ති කෙරෙහි බලපෑව ද මෙරට කලාකරුවා බුදු දහමෙන් ලැබූ සංයමය මුල් කර ගනිමින් නිරවුල් කලා නිර්මාණ බිහිකිරීමට සමත් විය.

පුරාණ ගොඩනැගිලි ආශ්‍රිත කලා අංග ලෙස සඳකඩ පහණ, කොරවක්ගල, මුරගල, ස්ථූප වාහල්කඩ පොකුණු ආදිය හඳුනාගත හැකි ය. මෙවැනි අංග අලංකරණය සඳහා යොදා ගෙන ඇති සත්ත්ව රූප සුවිශේෂී වේ. මේ සඳහා ජීවමාන සත්ත්ව රූප මෙන් ම කල්පිත හෙවත් සිතින් මවා ගත් සතුන් ද යොදාගෙන තිබේ. ශ්‍රී ලංකාව පුරා විහිදී ඇති ගොඩනැගිලි අශ්‍රිත ව විවිධ සත්ව රූප දැකගත හැකි ය. මෙලෙස සත්ත්ව රූප භාවිතය පිළිබඳ ව දාර්ශනික මත බොහෝමයක් සඳකඩපහණ මුල් කරගෙන ඉදිරිපත් වී තිබේ. එච්.සී. පී බෙල් ප්‍රකාශ කොට ඇත්තේ ඇතා , අශ්වයා, ගවයා , සිංහයා සතර දිසාවන් සංකේතවත් කරන බවයි (සේනාධීර ගුණපාල: 1999 : පුරාවිද්‍යා: 70). අනුරාධපුර විජයාරාමයේ සිව් දිග නිදන් කර තිබූ සත්ව රූප සතරේ පිහිටීම මේ සඳහා මුල් කර ගෙන තිබේ. සෙනරත් පරණවිතානයන්ට අනුව සඳකඩ පහණේ සතුන් ඇතුළු අනෙකුත් කැටයම් වලින් බුදු දහමට අයත් දාර්ශනික සංකල්පයක් නිරූපණය වේ (සේනාධීර ගුණපාල: 1999 : පුරාවිද්‍යා: 71). ඒ අනුව ඉහතින් සඳහන් කළ සතුන් හතර දෙනාගෙන් ජාති, ජරා, ව්‍යාධි, මරණ යන සිවු විපත නියෝජනය කෙරේ. වික්‍රමසිංහගේ මතය වන්නේ හින්දු ආගමික සංකල්පය අවමානයට ලක් කිරීමට මෙම සතුන් යොදා ගත් බවයි (සේනාධීර ගුණපාල: 1999 : පුරාවිද්‍යා: 72). සඳකඩපහණට අමතර ව වෙනත් ගොඩනැගිලි අංග සඳහා ද විවිධ සතුන් යොදා ගෙන තිබේ. මේ අනුව යෙදී ඇති සත්ව රූප හා ගොඩනැගිලි අංගය අනුව සත්වරූප භාවිතයේ යම් දාර්ශනික සංකල්පයක් ඇත්ද යන්න විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණයි.

ශ්‍රී ලංකාවට බුදුදහම සම්ප්‍රාප්තවීමෙන් අනතුරුව මිහින්තලේ ඉදිවෙන ගොඩනැගිලි ආශ්‍රිත ව සත්ත්ව රූප යෙදී ඇති කැටයම් දක්නට ලැබේ. මේ පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පහත සඳහන් සත්ත්ව රූප කෙරෙහි අවධානය යොමු කොට ඇත.

**නාග රූපය**

භාරතීය කලාවේ මෙන් ම බෞද්ධ කලාවේ ඉපැරණි කැටයම් අතර සුවිශේෂත්වයක් නාග රුවට හිමි වේ. සශ්‍රීකත්වය මුල් කරගත් නාග සංකේතය ලක්දිව පමණක් නොව ඉන්දියාව මිසරය කාම්බෝජය ආදී රටවල පවා පැතිරී තිබූ බවට සාධක තිබේ. මෙක්සිකෝවේ රාජ ඔටුන්නේ නාග සංකේතය ඇත. සිරියාවේ නාග වන්දනය පැතිරී තිබුණු බවට අසල්වැසි ඉන්දියාවේ හස් එබූ කාසිවල සංකේත තුළින් හඳුනාගත හැකි ය (ජානගේ විමල් :2000: නිශ්ශංක :65). මේ ආකාරයට ලෝකය විවිධ රටවල් වල ගෞරවයට හා පූජනීයත්වයට ලක් වූ සත්ව සංකේතයක් ලෙස නාග සංකේතය සඳහන් කළ හැකි ය. ශ්‍රී ලාංකීය ජනයා තුළ නාගයා කෙරෙහි විශේෂ අවධානයත් යොමු වී ඇත්තේ කෘෂිකර්මාන්තය හා බැඳුණු වාරි කර්මාන්තය තුළ නාග සංකේතය විශේෂ වීම නිසා ය. බෞද්ධ සාහිත්‍යයේ විවිධ ජාතක කතා තුළ ද නාග සංකේතය ඉතා ගෞරවනීය ලෙස යොදා ඇත. බුදුරජාණන් වහන්සේට සත් සතිය ගත කිරීම සඳහා ද නාග රාජයෙකුගේ රැකවරණය ලැබී තිබේ. ක්‍රි.පූ 6 වැනි සියවසයේදී ලංකාවේ නාග ගෝත්‍රික ජන කොටසක් සිටි බවටද මහා වංශය වැනි ඓතිහාසික මූලාශ්‍ර වල සඳහන් වේ. නාගයන්ට ශ්‍රී ලංකාවේ ජන සමාජයේ තිබුණු සැළකිල්ල නිසා රජවරුන් නාග නම පෞද්ගලික නම් සඳහා යොදා ගෙන තිබේ. පැරණි ජන සමාජය තුළ ධනය වස්තු දේපළ සඳහා ආරක්ෂකයෙකු ලෙස නාගයා සලකා ඇත. වාරි ශිෂ්ටාචාරය තුළ නාග සංකේතය භාවිතා කරන්නට ඇත්තේ ජලයෙහි ආරක්ෂකයෙකු ලෙස විය හැකි ය.

මිහින්තලේ පුරාණ ගොඩනැගිලි අතර නාග පොකුණ නාගයාගේ නමින් ම වෙන් කර තිබීම සුවිශේෂී වේ. මිහින්තලේ කඳු මුදුනේ වාරිමාර්ග පද්ධතිය හා සම්බන්ධ ප්‍රධාන ජලාශයක් ලෙස නාග පොකුණ හඳුනාගත හැකි ය. මහාවංශයේ **නාගසොණ්ඩි** හා **නාග තුෂ්ක** යන් නම් වලින් හඳුන්වා ඇත්තේ මෙම පොකුණ වේ (ලගමුව අරිය: 2009: 150). මෙලෙස නාග ලෙස නම් යෙදී ඇත්තේ එහි නෙලා තිබෙන නාග රූපය නිසා විය හැකි ය. පොකුණ මාධ්‍යයේ ස්වභාවික ගල් පර්වතයෙහි ඇති නාග රූපය පොකුණෙන් මතු වී ඉහළට නැගී ඇත. තනි කඳ සහිත නාගයාගේ ගෙල අසළ දී පෙන ගොබය පහකට බෙදී ඇත. මේ අනුව නාගයන් පස් දෙනෙක් ඉන් නිරූපණය වේ. සජීවී නාගයෙකු මෙන් අලංකාර ව නිමවා ඇති මෙම නාග රූපය පැරණි හෙළ කලා කරුවාගේ උසස් නිර්මාණයකි. නාගයා නාග මාණික්‍ය රකින්නා සේ මෙම පොකුණට අරක්ගෙන ආරක්ෂා කරනවා යන අදහසින් මෙම පොකුණෙහි නාග රූපය නිර්මාණය කර ඇති බව උපකල්පනය කළ හැකි ය.

එමෙන් ම කණ්ටක චෛතියේ වාහලකඩහි ද නාග රූපයක් දක ගත හැකි ය. මෙලෙස වාහලකඩ සඳහා නාග රූපය භාවිතා කරන්නට ඇත්තේ කුමන හේතුවක් මතද යන්න විමසීමේ දී කණ්ටක චෛතියේ කැටයම් කිහිපයකට ම සම්බන්ධ වන පරිදි නාග රූප කිහිපයක් ම දක්නට ලැබේ. ඒ අතර පෙන පහක් සහිත නාග රූපයක් ද තිබේ. මෙහි නාග රූපය නිරූපණය කර තිබෙන්නේ ස්වභාවික ලෙස දරණ ගසාගෙන සිටින ආකාරයෙන් නොව වල්ගයෙන් ඉහළට සිටගෙන සිටින්නාක් මෙනි. නාගයාට ඉහළින් ඇති ඡත්‍රය මගින් නාගයාට ගෞරව දක්වන බව ප්‍රකාශිත වේ. එමෙන් ම දකුණු වාහල්කඩ දෙපැත්තේ ඇති ස්ත්‍රී හා පුරුෂ නාග රුව දෑත් එක්කොට වැඳ ගෙන සිටියි. මෙලෙස මිහින්තලේ වාහල්කඩෙහි අන් කිසි ම වාහල්කඩක දක ගත නො හැකි ලෙස නාග රූපය භාවිතය කැපී පෙනේ. මිහින්තලේ මහා සෑය හා ගිරිභඩු ස්ථූපයෙන්ද කුඩා ප්‍රමාණයේ ලෝහ නාග රූප සොයාගෙන තිබේ. (ලගමුව අරිය: 2009: 161) මේවායින් පැහැදිලි වන්නේ ද මිහින්තලේ හා නාගයා සම්බන්ධයෙන් කුමක් හෝ සම්බන්ධයක් පැවති බව ය. මෙසේ ශ්‍රී ලංකාවේ කිසිදු ස්ථානයක නොමැති නාග සම්බන්ධයක් මිහින්තලේ හා සම්බන්ධ ව පැවත තිබෙන බව ඉන් අවබෝධකර ගත හැකි ය.

**සිංහ රුව**

සිංහලයන්ගේ ජය සංකේතය ලෙස සලකනු ලබන සිංහයා සිංහලයාගේ සමාරම්භක කතාවේ ද විශේෂ තැනක් ලබා ගනී. සිව්පා ලොවෙහි නායකත්වය දරණ සිංහයාට භාරතීය කලාවේ මෙන් ම බෞද්ධ කලාවේ ද විශේෂ තැනක් හිමි වේ. බුදුන්වහන්සේ ට ශාක්‍ය සිංහ ලෙස ද, රාජසිංහ ලෙස රාජකීය නාමයක් ද පැවත තිබේ. ඊට හේතු වන්නේ සිංහයා සතු ව ඇති දුලබ ගුණාංග වේ. ආනන්ද කුමාරස්වාමි මහතා සිංහයාගේ චරිත ලක්ෂණ පිළිබඳ චීන කෘතියක මෙසේ සඳහන් කරයි.

"***ව්‍යාඝ්‍රයාගේ මෙන් පෙනුමකුත්, පිංගල වර්ණ හෝ ඇතැම් විට නිල්වන් වූ වර්ණයකුත් ඇති සිංහයා මුකු - ඉඹු නමින් හැඳින්වෙන ඝන ලෝම සහිත සුනඛයාට සමාන පෙනුමක් ඇති සතෙකි. ලෝහ මෙන් ශක්තිමත් වූ විශාල හිසකුත්, දිග නගුටකුත්, කොකු වැනි දළත් නවන ලද කනුත් ඌට ඇත. ඇස් විදුලිය මෙන් ලෙළදෙන අතර ගර්ජනය මේඝ ගර්ජනාවක් වැන්න*** "
(නිකපිටිය කෞමුදී:15 කලාපය: 56)

සාරනාත්හි සුප්‍රකට අශෝක කුළුණ ද සුවිශේෂී වේ. මහායාන බුදු සමයෙහි වැදගත් තැනක් හිමි වන සිංහ නාද හා මංජු ශ්‍රී ලෝකේශ්වරත්, හින්දු සමයෙහි වැදගත් තැනක් හිමි දුර්ගා මහීෂමර්දිනී දෙවියන් නිරූපණය කර ඇත්තේ ද සිංහ රූප මත හිඳින සේ ය. බාධා දිනීමේ ශක්තියත් ප්‍රඥාවත් නිරූපණය කරන්නා වූ රූපයක් ලෙස ඇතා සහ සිංහයා එක් කොට ගජසිංහ නමින් රූපයක් හෙළ කලාකරුයා බිහි කර තිබේ. (නිකපිටිය කෞමුදී:15 කලාපය: 57)

මිහින්තලේ ගොඩනැගිලි ආශ්‍රිත ව සිංහ පොකුණෙහි මෙන් ම කණ්ටකචෛති වාහල්කඩෙහි ද සිංහ රූපය දැක ගත හැකි ය. කණ්ටකචෛති වාහල්කඩෙහි උතුරු වාහල්කඩ

ගල් කණුව මත සිංහ රූපය පිහිටුවා තිබේ. එච් සී පී බෙල්ට අනුව ඇතා, අශ්වයා, සිංහයා, ගවයා සතර දිසාව නියෝජනය කරනු ලබයි. ඒ අනුව බලන කල උතුරු දෙසින් සිංහයා යොදා කණ්ටක චෛතියේ උතුරු දෙස පෙන්වා දී ඇති බව උපකල්පනය කළ හැකි ය.

සිංහයාගේ නමින් ම නම් කරන ලද සිංහ පොකුණ ද ඉතා වැදගත් වේ. සිංහ පොකුණ ලෙස නම් ලැබෙන්නට ඇත්තේ පොකුණ අභියස පසුපස දෙපා වලින් නැගී සිටින විශාල ශෛලමය සිංහයෙකුගේ මූර්ති කැටයම නිසා විය හැකි ය. සිංහයාගේ ඉදිරිපස දෙපා ඉදිරියට විහිදා දෙපසට කරගෙන සිටින ආකාරයේ නිර්මාණයේ සිංහයා ඉදිරියට පනින්නාක් මෙන් පෙනේ. සිංහ රූපයේ මුඛයෙන් ජලය පිටවෙන ලෙස සකස් කර තිබේ. මේ සිංහයා කේශර සිංහයෙකි. පාද, ගාත්‍රා, ශරීරයේ මාංශ පේශී ආදිය ඉතා ජීවමාන අයුරින් නිර්මාණය කර තිබේ. සිංහ පොකුණ මත තිබෙන අවසාන පීල්ල සිංහ මුඛ සහිත කැටයමකින් නිර්මාණ ය කර තිබේ.

සිංහ පොකුණේ ශෛලමය ගල් පුවරු මත හා බොරදම් වල සත්ව රූප මෝස්තර ආදිය ද දැකිය හැකි ය. ඒ අතර ද විවිධ වූ සිංහ රූප තිබේ. මෙම බොරදම් අතර තීරුවක අඩි තුනෙන් තුනට ඉදිරියට මුහුණලා පසුපස දෙපාවලින් සිටගෙන ඉදිරි දෙපාවලින් බොරදම ඔසවාගෙන සිටින සිංහ කැටයමක් දක්නට ඇත. අලංකාරයෙන් යුක්ත මෙම කැටයම තුළින් පෞඪත්වය හා නිර්භීත බව නිරූපණය වේ. මෙම කැටයම් අතර ඉදිරියට සිටින ලෙස පසුපස ගාත්වලින් වාඩි වී සිටින කේශර සිංහයෙකු දක්නට ලැබේ. ඌ නිර්භීත බව පෙන්නුම් කරන කේශර සිංහයෙකි. මේ කැටයම් අතරම ගජසිංහ රූපය දක්නට ලැබීම ද සුවිශේෂී වේ. ගජසිංහ කැටයමෙහි කඳ හා පාද සිංහයාගේ වන අතර හිස සහ මුහුණ ඇතාගේ ය.

තව ද පසු පස බලමින් ඉදිරියට ගමන් කරන සිංහ රූපයක් ද දක්නට ලැබේ. සිංහ පොකුණ ලෙස නම් ලත් මෙම පොකුණ විවිධාකාර වූ සිංහ කැටයම් වලින් ද අලංකරණය වී තිබේ.

**හස්ති රුව**

ඇත් රූපය ජාතක කතාවල හා ඓතිහාසික චිත්‍රයන්හි බහුල ව දක්නට ලැබේ. පුරාණ භාරතීය කලාවේ බොහෝ ලෙස දක්නට ලැබෙන ඇතා මගුල් ලකුණු එකසිය අටෙන් එකකි. ස්තූප වාස්තු විද්‍යාවේ හස්ථිප්‍රාකාර නමින් අංගයක් ද දක්නට ලැබේ. බෞද්ධ සාහිත්‍යයේ බොහෝ උපමා සඳහා ඇතා යොදා ගෙන තිබේ. බුදුන් වහන්සේටද හස්ථි නාග යන නම භාවිතා කර ඇත (ලගමුව අරිය: 2009: 208). පෙරහැරේ සධාතුක කරඬුව වඩම්මවන්නේ ද ඇතු පිටේ ය. එච් සී පී බෙල්ට අනුව දිසා සතරෙන් එක් දිසාවක් දැක්වීම සඳහා ඇත් රූපය භාවිතා කර තිබේ. මිහින්තලේ කණ්ටක චෛතියෙහි නැගෙනහිර වාහල්කඩ මත ඇත් රූපය නැගෙන හිර දිසාව නිරූපණය කරන බව උපකල්පනය කළ හැකි ය. වාහල්කඩෙහි බොරදම් අතර හස්තියාගේ ඉදිරි පාර්ශවය දැක්වෙන මූර්ති පෙළකි. පොදුවේ සෑම වාහල් කඩකම පාහේ මෙවැනි හස්ති රූප දැකගත හැකි ය. මිහින්තලේ ඇත් වෙහෙර ලෙස හඳුන්වනු ලබන ස්ථානයෙහි පිය

ගැටපෙළ අභියස ඇත් රූප සහිත නිර්මාණ දෙකක් දක්නට ලැබේ. ඇතාගෙන් ආරක්ෂාව, නිර්භීත බව හා ගාම්භීරත්වය ද නිරූපණය වන හෙයින් පූජනීය ගොඩනැගිලි අලංකරණය සඳහා ඇති රූප භාවිතා කරන්නට ඇත. මිහින්තලේ සිංහ පොකුණේ කැටයම් අතර ද හස්ති රාජයෙකු සමඟ සිටින මිනිසෙකු නිරූපණය කර තිබේ. සිංහ පොකුණේ කැටයම් අතර ට මෙම විශේෂ රූපය පැමිණියේ කෙසේ ද යන්න ප්‍රශ්නයකි. මේ සඳහා විවධ මත ඉදිරිපත් වී තිබේ. මෙමගින් නිරූපණය වන්නේ වෙස්සන්තර ජාතකයේ එන වෙස්සන්තර රජු සහ ඇලි ඇතා විය හැකි බව එක් මතයකි (ලගමුව අරිය: 2009: 169). බෞද්ධ සාහිත්‍යයේ ද සඳහන් වන පරිදිඇලි ඇතා වැස්ස වැස්සවීමේ සමතෙකි. වියළි කලාපයට අයත් ප්‍රදේශයක පවතින ජලය ගබඩා කර ප්‍රයෝජනයට ගන්නා මේ තටාකයෙහි නිරූපණය වන්නේ ඇලි ඇතා විය හැකි බව උපකල්පනය කළ හැකි ය. ඉසුරුමුනියේ පොකුණෙහි ද ඇත් රූප දක්නට ලැබේ. එම නිසා ජලය සම්බන්ධ ව සුවිශේෂත්වයක් ගන්නා ඇතා සිංහ පොකුණේ කැටයම් අතරට එක් කරන්නට ඇත.

**ගවරුව**

සිංහල කැටයම් කලාවෙහි නිරූපිත සත්ත්ව රූප අතරින් ගව රූපයට ද උසස් තැනක් හිමි වේ. හින්දු ආගමෙහි පූජනීයත්වයට ලක්වන ගවයා පොළොන්නරු යුගයේ දී සඳකඩ පහණින් ඉවත් කරන ලද්දේ ද හින්දු ආගමික සංකල්පය මත බවට අදහසක් තිබේ. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ගවයාට පූජනීය ස්ථානයක් ලැබී තිබුණි. එච් සී පී බෙල්ට අනුව සතර දිසාවෙන් එක් දිසාවකට ගවයා නිරූපණය කරයි. විශාලත්වය, සුවිශේෂ කාය ශක්තිය, සහනශීලිතිවය යන ගුණයන් ගවයාගෙන් නිරූපණය වේ. මගුල් ලකුණු 108 අතරට ගවයා ද එක් වේ (සේනාධීර ගුණපාල : 1999 පුරාවිද්‍යා :73). කණ්ඨක චෛතියේ දකුණු වාහල්කඩේ ගව රූප දෙකක් දක්නට ලැබේ. බෙල්ට අනුව එය දකුණු දිසාව නිරූපණය සඳහා යොදන්නට ඇත. මිහින්තලේ ගොඩනැගිලි ආශ්‍රිත ව ගවයා දැක ගත හැකි එක ම ස්ථානය කණ්ටකචෛතිය ලෙස හැඳින්වීම නිවැරදි ය. ඉහත සඳහන් කළ ගවයා සතු සුවිශේෂී ගුණ මුල් කර ගනිමින් මෙම ස්ථාන සඳහා ගව රූප යොදන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

**මකර රුව**

මකරා වනාහි රාශි චක්‍රයේ සංකේතයකි. මඟුල් ලකුණු අටෝරාසියෙන් එකකි. එසේ ද භාරතීය අනංගයාගේ ධ්වජයයි (කුමාරස්වාමි ආනන්ද :1994: 82). කණ්ටකචෛතියේ වාහල් කඩෙහි මෙන් ම කොරවක් ගල් කිහිපයක ම මකර රුව දක්නට ලැබේ. බොරදමෙහි පිටතට නෙරා ඇති ලෙස නිර්මාණය කර ඇති මකරා මුව අයාගෙන සිටින ලෙස නිර්මාණය කර තිබේ. තියුණු දත් හා දිය මනාව නිරූපණය කර තිබේ. මිහින්තලයේ මනිනාග මන්දිරය ලෙස හැඳින්වෙන ගොඩනැගිලි සංකිරණය, ඉඳිකටු සෑය ගොඩනැගිලි සංකිර්ණයේ රාජගිරිලෙන ඉදිරිපිට සංඝාවාස සංකිරණයේ ගොඩ නැගිලි වල පිවිසුම් දොරටුවලත් අලංකාර මකර රූප

දැකගත හැකිය. කල්පිත රූපයක් වන මකර රුව සතු සුවිශේෂී ලක්ෂණ මුල් කර ලෙන ගොඩනැගිලි ආශ්‍රිත ව මකර රුව යොදන්නට ඇත.

**අශ්ව රුව**

අනෙක් සත්ත්ව මූර්තීන්ට සාපේක්ෂ ව අශ්ව මූර්තිය කැටයම් කලාව අල්ප වශයෙන් යොදා ඇත. භාරතයේ අශ්වයා පිළිබඳ සංකල්පය වෛදික යුගය තෙක් ඈතට දිව යයි. එකළ අශ්වමේධ යාග නම් වූ යාග ක්‍රමයක් පිළිබඳ ව ද මූලාශ්‍රයන්හි සඳහන් වේ. සිද්ධාර්ථ කුමරයා ගිහිගෙයින් නික්ම යන ලද්දේ අශ්වයෙකු පිට නැගී ය. එම නිසා බෞද්ධ සාහිත්‍යයේ අශ්වයාට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. කාය ශක්තිය මෙන් ම ජව වේගයත් සුපිරි දේහ විලාසයත් යන ගුණ අශ්වයාගෙන් නිරූපණය වේ. මෙම සුවිශේෂී ගුණ මුල් කරගෙන අශ්වයා මගුල් ලකුණු 108 අතරට ද එක්වේ (සේනාධීර ගුණපාල : 1999 :73). මිහින්තලේ කණ්ටකචේතිය බටහිර වාහල්කඩේ අශ්ව රූප දෙකක් දැකගත හැකි ය. එච්. සී .පී බෙල්ට අනුව සතර දිසාවෙන් එක් දිසාක් නිරූපණය කරන අශ්වයා කණ්ටකචේතියෙහි බටහිර දිසාව නිරූපණය කරයි.

**හංස රුව**

බුදුන්වහන්සේගේ ශ්‍රී පාද යුග්මයේ ද හංස සටහන් දෙකක් ඇත. හංසයා සිංහල බෞද්ධ කලාවේ ඉතා ජනප්‍රිය සතෙකි. ජලයෙන් කිරි දිය වෙන් කර බොන්නට හංසයා සමත්කමක් දක්වන බව සිංහල ජනයා පිළිගන්නා දෙයකි. එයින් කිය වෙන්නේ නරක දෙයින් ඉතා හොඳ දෙයක් තෝරා බේරාගැනීමේ හැකියාව හංසයාට තිබෙන බවයි. ලාංකේය කැටයම් කලාවේ බොහෝ කලාත්මක අංග සඳහා යොදා ගනු ලබන හංසයා සඳකඩ පහණේ සුවිශේෂත්වයක් ගත් සත්ත්වයෙකි. බෙන්ජමින් රෝලන් මහතාට අනුව හංස රූපයෙන් පස්වන දිසාව හෙවත් අහස නිරූපණය වන බව ප්‍රකාශ කරයි (සේනාධීර ගුණපාල : 1999 :70).බොහෝ සාහිත්‍ය නිර්මාණ සඳහා යොදා ගනු ලබන හංසයා පාරිශුද්ධයේ සංකේතයක් ලෙස දැක්වීම සිදු කොට ඇත. වාහල්කඩ කැටයම් සඳහා ද මෙම සංකල්පය හා අලංකාරය මුල් කරගෙන හංස රූප යොදන්නට ඇත. කණ්ඨක චේතියේ වාහල්කඩේ හංස පෙළ දකුණේ සිට වමට ගමන් කරයි. ඉතා ආඩම්බරයෙන් හා ලීලානේ ඉදිරියට ඇදෙන මෙම හංස පෙළ වාහල්කඩට අමුතුම අලංකරණයක් ගෙන දෙයි.

මිහින්තලේ ගොඩනැගිලි ආශ්‍රිත සත්ත්ව කැටයම් අධ්‍යන කිරීමේ දී පැහැදිලි වන කරුණක් නම් වෙනත් ස්ථාන වල සඳකඩපහණ ඇසුරින් විවාදයට තුඩු දෙන සත්ව රූප සඳකඩ පහණ හැර වෙනත් ගොඩනැගිලි ඇසුරින් දැකගත හැකි වීමයි. මිහින්තලේ ආශ්‍රිත එකදු සඳකඩපහණකවත් සතත්ව රූප දැකගත නො හැකි ය. එම සඳකඩපණන් විකාශය යුගයන් අනුව සිදුවූවක් බව උපකල්පනය කළ හැකිය හැකි ය.

ඉහතින් දැක්වූ සතුන් සියල්ලගෙන් ම මිනිස් දිවියේ යහ පැවැත්මට අවශ්‍ය ඉෂ්ටාර්ථවන **පරාක්‍රමය වික්‍රමය, වර්ධනය, පෝෂණය, කාය බලය, සහන ශක්තිය, ජව වේගය, රූප සවභාවය** යන ගුණාංග නිරූපණය වන බව එක් එක් නිර්මාණ පිළිබඳව විමර්ශනය කිරීමෙන් පැහැදිලි වේ.

**ආශ්‍රේය මූලාශ්‍ර හා ලිපි නාමාවලිය**

1994, කුමාරස්වාමි ආනන්ද, ***මධ්‍යකාලීන සිංහලකලා***, ජාතික කෞතුකාගාර දෙපාර්තුමේන්තුව

2009,ලගමුව ආරිය, ***මිහින්තලේ කැටයම්, මූර්ති හා බිතුසිතුවම්***, පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

2007,දේවේන්ද්‍ර ඩී.බී , ***සඳකඩපහන සහ වෙනත් ලිපි***, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, පී ද ඇස් කුලරත්න මාවත, කොළඹ

1999,සේනාධීර ගුණපාල, ***සඳකඩපහණේ සංකේතවලින් අදහස්වන කාර්ය පිළිබඳ නව මතයක්***, සිරිසමන් විජේතුංග, පුරාවිද්‍යා, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාක්ස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7

1972ගුණවර්ධන රණවීර, ලියනරත්න ජිනදාස (සං), ***පුරාතන ලංකාවේ මූර්ති හා චිත්‍ර කලා පිළිබඳව පරණවිතාන මහතා කළ පර්යේෂණ***, සෙනරත් පරණවිතාන, සංස්කෘතික ප්‍රකාශන සංගමය, කොළඹ

2000 දෙසැම්බර්, මනතුංග අනුර, අමරසිංහ මාලිංග, තිස්ස අනුර ඩී .එම්(සං) , ***නාග වන්දනයේ ඓතිහාසික පසුබිම හා නාග සංකේත***, විමල් ජානගේ, මධ්‍යම සංස්කෘතික අරමුදල